# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2316/49 - 2023 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2023.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2023 අංක 26/1

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/6/3

ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(1) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා මහතා, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්, 2023 ජනවාරි මස 20 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි මාස තුනක කාලයක් සඳහා පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**ඊ. එම්. එස්. බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්.

2023 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

EOG 01 - 0289/1

---

2023 අංක 26/2

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/6/3

ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(1) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, ආර්. එම්. ඩබ්ලිව්. එස්. සමරදිවාකර මහතා ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් 2023 ජනවාරි මස 20 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි පත් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**ඊ. එම්. එස්. බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්.

2023 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

EOG 01 - 0289/2

1A - G 38681 — 366 (2023/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*